WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**50 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2018 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2018

නාට්‍ය හා රංග කලාව I, II
நாடகமும் அரங்கியலும் I, II
Drama and Theatre I, II

## නාට්‍ය හා රංගකලාව II

※ **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

1. **දික්තල කාලගෝල** නාට්‍යය ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
   (i) දික්තල කාලගෝල නාට්‍යය රචනා කොට මුල්වරට නිෂ්පාදනය කරන ලද්දේ කවුරුන් විසින් ද? (ලකුණු 02 යි)
   (ii) එම නාට්‍ය පිටපත සංශෝධනය කොට 1975 වසරේ දී නිෂ්පාදනය කරන ලද්දේ කවුරුන් විසින් ද? (ලකුණු 02 යි)
   (iii) මෙම නාට්‍යයේ පූර්වරංගය යටතේ ඉදිරිපත් කෙරෙන අංගය කුමක් ද? (ලකුණු 02 යි)
   (iv) දික්තල, කාලගෝල යන දෙදෙනා එකිනෙකා සමග නොගැළපීමට හේතු වන කරුණු **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)
   (v) දික්තල කාලගෝල නාට්‍යයේ සංවාදවල ඔබ දකින විශේෂ ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)
   (vi) නාට්‍ය අවසානයේ දී කාලගෝල ගයන ගීතයේ අදහස කුමක් ද? (ලකුණු 02 යි)

2. (i) චරිත නිරූපණයට උපකාර වන නළු සිරුරට සම්බන්ධ අභිනය **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)
   (ii) නාට්‍යවල දක්නට ලැබෙන චරිත වර්ග පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 04 යි)
   (iii) චරිත නිරූපණයේ දී නළු-නිළියන් විසින් සැලකිල්ලට ගත යුතු කරුණු මොනවා දැයි පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

3. (i) රංගාලෝකය සඳහා භාවිත කෙරෙන විදුලි පහන් වර්ග **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)
   (ii) රංගාලෝකය සපයාගැනීමට අතීතයේ භාවිත කළ උපක්‍රම මොනවා දැයි සඳහන් කරන්න. (ලකුණු 04 යි)
   (iii) වේදිකා නාට්‍යයකට රංගාලෝකය අවශ්‍ය වන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

4. (i) කෝලම් රඟ දැක්වුණ ප්‍රදේශ **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)
   (ii) කෝලම් රඟ භූමියක රූපසටහනක් ඇඳ ඊට අයත් කොටස් නම් කරන්න. (ලකුණු 04 යි)
   (iii) සාම්ප්‍රදායික කෝලම් රංගයක චරිත ඉදිරිපත් කෙරෙන පිළිවෙළ සඳහන් කරන්න. (ලකුණු 06 යි)

5. (i) පූර්වරංගය යනු කුමක් ද? (ලකුණු 02 යි)
   (ii) නාඩගම්වල පූර්වරංගයේ දී කරළියට පිවිසෙන චරිත **හතරක්** නම් කරන්න. (ලකුණු 04 යි)
   (iii) නාඩගම් රඟ දැක්වීමට ආවේණික වූ ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 06 යි)

WWW.OLEVELAPI.COM

6. (i) වීදි නාට්‍ය යනු කුමක් දැයි පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)
   (ii) විවෘත වීදි නාට්‍ය කණ්ඩායම විසින් රඟ දක්වන ලද වීදි නාට්‍ය **හතරක** නම් සඳහන් කරන්න. (ලකුණු 04 යි)
   (iii) ශ්‍රී ලංකාවේ වීදි නාට්‍ය කලාවේ පුරෝගාමියකු පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 06 යි)

7. පහත දැක්වෙන කතා සාරාංශය පදනම් කරගෙන නාට්‍යෝචිත අවස්ථාවක් ගොඩනැගෙන පරිදි නාට්‍ය පෙළක් රචනා කරන්න. ඔබට කැමති පරිදි චරිතවල පුද්ගල නාම, ස්ත්‍රී පුරුෂ බව හෝ චරිත සංඛ්‍යාව වෙනස් කරගත හැකි ය.

   සුනිල් කතාන්දර ගොතා කීමට දක්ෂ ළමයෙකි. නාට්‍ය තරගයක් සඳහා ඉදිරිපත් කිරීමට නාට්‍යයක් නිපදවීමට ඔහු සූදානම් වෙයි. සුනිල් ගේ පන්තියේ මිතුරකු වන නිමල් රඟපෑමට දක්ෂ දඟකාර ළමයෙකි. දෙදෙනා එකතු වී නාට්‍යය පුහුණුවීමට සූදානම් වන විට ඒ බව ආරංචි වී දඩබ්බර හැඩි දැඩි සිසුවකු වන ජූඩ් එතැනට පැමිණෙයි. ඔහු නාට්‍යයේ රජු ගේ චරිතය තමාට දිය යුතු බව කියාසිටියි.

   (i) පසුබිම, කාලය හා චරිත මැවීමට අවශ්‍ය පරිදි රංග විධාන සමග සංවාද රචනා කිරීම සඳහා (ලකුණු 04 යි)
   (ii) චරිත අතර ගැටුමක් ඇති වන අයුරින් අවස්ථාව ගොඩනැගීම සඳහා (ලකුණු 04 යි)
   (iii) දෙගිඩියාව, කුතුහලය, උත්ප්‍රාසය සහිත නාට්‍යෝචිත අවස්ථාවක් නිර්මාණය කිරීම සඳහා (ලකුණු 04 යි)

***

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...